**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 85/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 18/01/2024
පැය 1050

# මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01.** **2024.01.17 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 03 | 80 | 200 | තඹ දහර 02 |

වැටලීම් සිදුකර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.01.17 වන දින දහවල් කාලයේදී තණමල්විල පොලිස් වසමේ කහකුරුල්ලන පැලැස්ස ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ගංජා පැළ **1760 ක් පමණ වගා කර තිබු ගංජා හේනක් වටලා** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන හම්බේගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අනවසර ලෙස පතල් කැණීම් සිදුකල සැකකරුවන් දහඅට දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.01.17 වන දින දහවල් කාලයේදී කහවත්ත,ඕපනායක සහ රත්නපුර පොලිස් වසම්වල දී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් සිදුකර **අනවසර ලෙස පතල් කැණීම් සිදු කරමින් සිටි** සැකකරුවන් 18 දෙනෙකු පතල් කැණීමට යොදාගත් JCB යන්ත්‍ර 02 ක් සහ කොම්ප්‍රෂර් යන්ත්‍ර 02 ක් සමඟ අත්අඩංගුවට ගෙන අදාල පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33 සහ 70 අතර වයස් වල පසුවන රත්නපුර, ඇහැලියගොඩ, නිවිතිගල, ගොඩකදෙණිය, ඕපනායක සහ කහවත්ත, ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

කහවත්ත, ඕපනායක සහ රත්නපුර පොලිසි වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.